# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත

பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்

CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My Ref. | CSS/7/1/9 | ඔබේ අංකය / உனது இல / Your Ref. | | දිනය / திகதி / Date | 2018.07.31 |

ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) **02-2018**

දකුණු පළාත් සභාවේ සියළුම
ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්,
ගණන් දීමේ නිලධාරීන්,
ප්‍රධාන ගණකාධිකාරී වරුන්
හා ගණකාධිකාරීවරුන් වෙත.

**<u>ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් (ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර) I,II හා III වෙළුම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් භාණ්ඩාගාරයේ ලේකම් විසින් නිකුත් කර ඇති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 265/2018 හා 2018.05.10 දිනැති ලිපිය හා බැඳේ. (එම චක්‍රලේඛයේ පිටපතක් මේ සමග අමුණා ඇත.)

**02.**එම චක්‍රලේඛය දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීමට ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/1/6/3/1 හා 2018.06.12 දිනැති ලිපිය මඟින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇත.

**03.**ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති කමිටුව මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ සහභාගීත්වය සහිතව ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් (ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර) I,II හා III වෙළුම ප්‍රකාශයට පත්කරන ලද අතර මෙම වෙළුම තුළ පහත සඳහන් ප්‍රමිතීන් 20 ඇතුළත් වේ.

1. ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර - 1 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
2. ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර - 2 - මුදල් ප්‍රවාහ ප්‍රකාශන
3. ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර - 3 - ගිණුම්කරණ ප්‍රතිපත්ති,ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් හා වැරදි
4. ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර - 4 - ණය ගැනුම් පිරිවැය
5. ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර - 5 - විදේශ විනිමය අනුපාතයන්හි වෙනස්වීම්වල බලපෑම
6. ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර - 6 - වාර්තාකරණ දිනයෙන් පසු සිදුවීම්
7. ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර - 7 - දේපළ,පිරියත හා උපකරණ
8. ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර - 8 - ප්‍රතිපාදන,අසම්භාව්‍ය බැරකම් හා අසම්භාව්‍ය වත්කම්
9. ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර - 9 - තොග
10. ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර - 10 - අගය හුවමාරු ගනුදෙනු වලින් පැනනගින අයභාර
11. ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර - 11 - හුවමාරු නොවන ගනුදෙනු වලින් වන අයභාර (බදු සහ පැවරුම්)
12. ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර - 12 - කල්බදු
13. ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර - 13 - ආයෝජන දේපළ
14. ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර - 14 - සම්බන්ධිත පාර්ශවයන් හෙළිදරව් කිරීම
15. ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර - 15 - මූල්‍ය ප්‍රකාශන තුළ අයවැය ලේඛනයේ තොරතුරු ඉදිරිපත් කිරීම


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 2232343 | කාර්යාලය / காரியாலயம் / Office 091 2234052, 091 2226118 | ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.

பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.



"විශිෂ්ටත්වයෙන් ① ට එන යහපාලනයක්"

16. ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර - 16 - ඉදිකිරීම් කොන්ත්‍රාත්
17. ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර - 17 - ඛණ්ඩ වාර්තාකරණය
18. ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර - 18 - කෘෂිකර්මය
19. ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර - 19 - සේවක ප්‍රතිලාභ
20. ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර - 20 - අස්පෘශ්‍ය වත්කම්

**04.**මෙම ගිණුම්කරණ ප්‍රමිතීන් ජාත්‍යන්තරව පිළිගත් මනා පරිචයන්ට අනුකූලව රාජ්‍ය අංශයේ මූල්‍ය විශ්ලේෂණය, සැලසුම්කරණය හා කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා පහසුකම් සපයමින් ගුණාත්මක මූල්‍ය ගිණුම්කරණයක් හා වාර්තාකරණයක් සඳහා වූ රාමුවක් සපයා දෙයි.

**05.**මෙම ප්‍රමිතීන් උපචිත පදනම මත ගිණුම්කරණය අනුගමනය කරන සියළුම ව්‍යවස්ථාපිත මණ්ඩල (වානිජ නොවන රාජ්‍ය සංස්ථා) හා පළාත් පාලන ආයතන සඳහා අවශ්‍ය පරිදි අදාළ කර ගත හැකි බව චක්‍රලේඛයේ සඳහන් කර ඇත.මෙම ප්‍රමිතීන් පදනම් කර ගෙන පළාත් පාලන ආයතන සඳහා වන රාජ්‍ය අංශයේ සරල ගිණුම්කරණ ප්‍රමිතිය සකසා ඇත.මෙම ප්‍රමිතීන් මධ්‍යම රජයේ හා පළාත් සභා ආයතන උපචිත පදනම මත ගිණුම්කරණ ක්‍රමයට පරිවර්තනය වූ පසු භාවිතයට ගත හැකි වන අතර එසේ භාවිතයට ගැනීම දිරිගන්වනු ලබන බවත් සඳහන් කර ඇත.

**06.**2011.01.19 දිනැති PED 54 හා 2013.10.02 දිනැති අංක 03/2013 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ මගින් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සඳහා ප්‍රථම ප්‍රමිතීන් 10 දැනටමත් බලාත්මක කර ඇත.මෙම ප්‍රමිතීන් 10 අනුකූල වීම අනිවාර්යය වන අතරම 2018.01.01 දින හෝ ඊට පසු ආරම්භ කරන කාලපරිච්ඡේද ආවරණය කරමින් පිළියෙල කරන වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සඳහා නව ප්‍රමිතීන් 10 බලාත්මක වේ.

**07.** මෙම උපදෙස් අනුව කටයුතු කරන ලෙස කාරුණිකව දැනුම් දෙන අතර, මේ පිළිබඳව ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව යටතේ පවතින සියලු ආයතන දැනුවත් කරන ලෙසද වැඩිදුරටත් දන්වා සිටිමි.

ආර්. සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත්: **01.** සහකාර විගණකාධිපති, දකුණු පළාත : දැ.ගැ.ස.
02.අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, දකුණු පළාත් සභාව : දැ.ගැ.ස.

# මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
# நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சு
# MINISTRY OF FINANCE AND MASS MEDIA

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01. இலங்கை | The Secretariat, Colombo 01 Sri Lanka

කාර්යාලය - මුදල් / அலுவலகம் - நிதி / Office - Finance: (+94)-11-2484500, (+94)-11-2484600, (+94)-11-2484700
ෆැක්ස් - මුදල් / பெக்ஸ் - நிதி / Fax - Finance: (+94)-11-2449823

කාර්යාලය - ජනමාධ්‍ය / அலுவலகம் - வெகுசன ஊடக / Office - Mass Media: (+94)-11-2513459, (+94)-11-2513498, (+94)-11-2512324
ෆැක්ස් - ජනමාධ්‍ය / பெக்ஸ் - வெகுசன ஊடக / Fax - Mass Media: (+94)-11-2513458

වෙබ් අඩවි / வெப் சைட்கள் / Websites: www.treasury.gov.lk, www.media.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: **SA/MA/MA/CIRCULAR**  
ඔබේ අංකය / உமது இல. / Your No.:  
දිනය / திகதி / Date: **2018.05. 10**

රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක: 265/2018

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්

පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

දිස්ත්‍රික් ලේකම්වරුන්

ව්‍යවස්ථාපිත මණ්ඩල හා පළාත් පාලන ආයතන සභාපතිවරුන්

**<u>ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් (ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර) I, II හා III වෙළුම</u>**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති කමිටුව මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ සහභාගීත්වය සහිතව ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් (ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර) I, II හා III වෙළුම ප්‍රකාශයට පත් කරන ලදී. මෙම වෙළුම් තුළ පහත සඳහන් ප්‍රමිතීන් 20 ඇතුළත් වේ.

1. ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර - 1 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
2. ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර - 2 - මුදල් ප්‍රවාහ ප්‍රකාශන
3. ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර - 3 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් හා වැරදි
4. ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර - 4 - ණය ගැණුම් පිරිවැය
5. ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර - 5 - විදේශ විනිමය අනුපාතයන්හි වෙනස්වීම්වල බලපෑම
6. ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර - 6 - වාර්තාකරණ දිනයෙන් පසු සිදුවීම්
7. ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර - 7 - දේපළ, පිරියත හා උපකරණ
8. ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර - 8 - ප්‍රතිපාදන, අසම්භාව්‍ය බැරකම් හා අසම්භාව්‍ය වත්කම්
9. ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර - 9 - තොග
10. ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර - 10 - අගය හුවමාරු ගනුදෙනුවලින් පැනනගින අයභාර
11. ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර - 11 - හුවමාරු නොවන ගනුදෙනුවලින් වන අයභාර (බදු සහ පැවරුම්)
12. ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර - 12 - කල්බදු
13. ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර - 13 - ආයෝජන දේපළ
14. ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර - 14 - සම්බන්ධිත පාර්ශවයන් හෙළිදරව් කිරීම

15. ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර - 15 - මූල්‍ය ප්‍රකාශන තුළ අයවැය ලේඛණයේ තොරතුරු ඉදිරිපත් කිරීම
16. ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර - 16 - ඉදිකිරීම් කොන්ත්‍රාත්
17. ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර - 17 - ඛණ්ඩ වාර්තාකරණය
18. ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර - 18 - කෘෂිකර්මය
19. ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර - 19 - සේවක ප්‍රතිලාභ
20. ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර - 20 - අස්පෘශ්‍ය වත්කම්

02. මෙම ගිණුම්කරණ ප්‍රමිතීන් ජාත්‍යන්තරව පිළිගත් මනා පරිචයන්ට අනුකූලව රාජ්‍ය අංශයේ මූල්‍ය විශ්ලේෂණය, සැලසුම්කරණය හා කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා පහසුකම් සපයමින් ගුණාත්මක මූල්‍ය ගිණුම්කරණයක් හා වාර්තාකරණයක් සඳහා වූ රාමුවක් සපයා දෙයි.

03. මෙම ප්‍රමිතීන් උපචිත පදනම මත ගිණුම්කරණය අනුගමනය කරන සියළුම ව්‍යවස්ථාපිත මණ්ඩල (වානිජ නොවන රාජ්‍ය සංස්ථා) හා පළාත් පාලන ආයතන සඳහා අවශ්‍ය පරිදි අදාළ කර ගත හැකිය. මෙම ප්‍රමිතීන් පදනම් කරගෙන පළාත් පාලන ආයතන සඳහා වන රාජ්‍ය අංශයේ සරල ගිණුම්කරණ ප්‍රමිතිය සකසා ඇත. මෙම ප්‍රමිතීන් මධ්‍යම රජයේ හා පළාත් සභා ආයතන උපචිත පදනම මත ගිණුම්කරණ ක්‍රමයට පරිවර්තනය වූ පසු භාවිතයට ගත හැකි වන අතර එසේ භාවිතයට ගැනීම දිරිගන්වනු ලැබේ.

04. 2011.01.19 දිනැති PED 54 හා 2013.10.02 දිනැති අංක 03/2013 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ මගින් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සඳහා ප්‍රථම ප්‍රමිතීන් 10 දැනටමත් බලාත්මක කර ඇත. මෙම ප්‍රමිතීන් 10 අනුකූල වීම අනිවාර්යය වන අතරම 2018.01.01 දින හෝ ඊට පසු ආරම්භ කරන කාලපරිච්ඡේද ආවරණය කරමින් පිළියෙල කරන වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සඳහා නව ප්‍රමිතීන් 10 බලාත්මක වේ.

05. මෙම ගිණුම්කරණ ප්‍රමිතීන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළ කර ඇති අතර ප්‍රකාශිත පොත් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙන් මිලදී ගත හැක.

ආර්.එච්.එස්. සමරතුංග

භාණ්ඩාගාර ලේකම්

පිටපත්:

1. විගණකාධිපති